ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම
இலங்கை பத்திரிகை முறைப்பாட்டு ஆணைக்குழு
Press Complaints Commission of Sri Lanka

# ප්‍රවෘත්ති නිවේදනයයි

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ ආරවුල් නිරාකරණ මණ්ඩලයේ සභාපති ලෙස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ හිටපු මහ ලේකම් හා ශ්‍රී ලංකාවේ පළමු දුක්ගන්නාරාළ සෑම් විජේසිංහ මහතා යළිත් නිතරගයෙන් තේරී පත්විය. පසුගිය අඟහරුවාද (30) පැවති ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ විශේෂ මහා සභා රැස්වීමේදී හෙතෙම එම ධූරය සඳහා නැවතත් පත්විය.

සෑම් විජේසිංහ මහතා 2003 වසරේ සිට ආරවුල් නිරාකරණ මණ්ඩලයේ සභාපති ධූරය දරයි.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමට දායකවන , පුවත්පත් හා පාඨකයින් අතර හටගන්නා ආරවුල් කොමිසමේ ලේකම් කාර්යාලයට යොමු කිරීමෙන් පසුව සමතකරණ හෝ මැදිහත්කරණ ක්‍රියාවලිය මගින් විසඳීමට නොහැකි අවස්ථාවන්හි දී බේරුම්කරණ ක්‍රියාවලිය මඟින් එම ගැටළු නිරාකරණය කිරීමේ වගකීම ආරවුල් නිරාකරණ මණ්ඩලය ට පැවරෙයි. ආරවුල් නිරාකරණ මණ්ඩලය සාමාජිකයින් එකොළොස් දෙනෙකුගෙන් සමන්විත වේ. මෙම සාමාජිකයින් එකොළොස් දෙනා අතරින් පස් දෙනෙක් මාධ්‍ය ක්ෂේත්‍රය නියෝජනය කරන අතර සෙසු සාමාජිකයින් හයදෙනා මාධ්‍ය ක්ෂේත්‍රයේ නොවන අය වේ. සභාපති ධූරය හිමිවන්නේ ද මාධ්‍ය ක්ෂේත්‍රයේ නොවන බහුතරයේ නියෝජිතයකුට ය.

මාධ්‍යවේදීන්ට නීති මගින් දඬුවම් පැනවීමට හා සිරගත කිරීමට හැකි බලයක් සහිත පුවත්පත් මණ්ඩලය වෙනුවට 2003 වසරේ දී ස්ථාපිත කළ ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම ජනමාධ්‍ය කර්මාන්තය විසින් හඳුන්වාදුන් ස්වයං නියාමන යාන්ත්‍රණය වේ. එය ශ්‍රී ලංකා කර්තෘ සංසද වෘත්තීය ප්‍රතිපත්ති මාලාව ක්‍රියාත්මක කරන අයතනයයි.

කිසියම් පුවත්පතකට එරෙහිව පවතින දුග්ගැනවිල්ලක් පිළිබඳව පාඨකයින්ට ප්‍රථමයෙන් පුවත්පතේ කර්තෘවරයාගේ අවධානයට යොමු කළ හැකිය. ඒ සඳහා සුදුසු විසඳුමක් නොලැබෙන්නේ නම් එම පාඨකයින්ට ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමට පැමිණිලි කළ හැක. මෙම කොමිසම ඊට අදාළ සියලු කටයුතු නොමිලේ සිදුකරයි.

පුවත්පත් පැමිණිලි කොමිසම 2003 වසරේ සිට පැමිණිලි 792 ක් සම්බන්ධයෙන් කටයුතු කර ඇත.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම, ශ්‍රී ලංකා පුවත්පත් හිමිකරුවන්ගේ සංගමය, ශ්‍රී ලංකා කර්තෘ සංසදය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, ශ්‍රී ලංකා වෘත්තීය පත්‍ර කලාවේදීන් ගේ සංගමය, දකුණු ආසියා නිදහස් මාධ්‍ය සංගමය, ශ්‍රී ලංකා ද්‍රවිඩ මාධ්‍ය සංවිධානය, ශ්‍රී ලංකා මුස්ලිම් මාධ්‍ය සංසදය සහ මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය යන සංවිධාන වල සහයෝගය ලබයි.

96 Kirula Road, Colombo 05, Sri Lanka - Tel: (94 11) 5353635, Fax: (94 11) 5335500
Web: www.pccsl.lk